




# මගේ වාසනාවේ සහතිකය

අපි දන්න සමහර අය ඉන්නවා හරිම වාසනාවන්තයි. එයාල ඉතාම ඉහල අධ්‍යාපනයක් සාර්ථකව ලබාගැනීමට වාසනාවන්ත වෙලා තියෙනවා. ඉහලම රැකියාවක් ලැබිලා. ලස්සන ගෙයක් හදාගෙන ලස්සනට ඉන්නවා. හරිම වාසනාවන්ත බිරිඳක්, ස්වාමි පුරුෂයෙක් ලැබිලා. එයාලා මොනවා කලත් හරි යනවා. හරිම වාසනාවන්තයි. ඒ අය දිහා බැලුවහම අපිටත් හරිම සතුටක් හිතෙනවා. ඒ එක්කම පොඩි දුකක් හිතට එනවා, මම එච්චචර වාසනාවන්ත නැත්තේ ඇයි කියලා. හැබැයි ඔය කියන දේවල් ලඟා කරගත්ත අයට ඒවා ලැබුනේ "වාසනාව" නිසාය කියලා අපට හිතුන ඇත්තටම ඊට වඩා බොහෝ දේවල් ඒ හා සම්බන්ධවී තියෙනවා.

ප්‍රධාන කාරණය තමයි "සූදානම". වාසනාව උදාකර ගැනීමේ අවස්ථාව ලැබෙන විට එය ලබාගැනීමට ඔවුන්ගේ තිබුන සූදානම. මෙම සූදානම තුල තියෙනවා කැපවීම, ධෛර්යය, නොපසුබස්නා වීර්යය, අධිෂ්ඨානය, අභියෝග හමුවේ නොසැලීම වැනි ගුණාංග රැසක්. මෙම කාරණා අතරින්, කැපවීම, නොපසුබස්නා වීර්යය හා අභියෝග හමුවේ නොසැලීම ගැන අද අපි කථාකරමු. යම් කෙනෙකුට නියමිත කාර්යයක් නොකිරීමට පාවිච්චි කලහැකි හේතුවකට අපි කියනවා බාධක කියලා. බොහෝ වෙලාවට අපිටම හිතෙනවා මේ බාධක ගැන අප කියන නිදහසට කරුණු හරිම සාධාරණයි කියලා.

බලන්න මොහොතකට දනගාන දරුවෙකු දිහා. මෙයා නැගිටින්න උත්සහ දරන බොහෝ වෙලාවට වෙන්නේ ආපහු බිමට වැටෙන එක. ඒ වැටෙන කොට සමහර වෙලාවට ඇඟට බොහෝම රිදෙනවා. එතකොට මේ දරුවා අඬනවා. මේ වැටීම හා වේදනාව හරිම බාධාවක් නේ. එය හරිම සාධාරන නිදහසට කාරණාවක් නේ නැගිටින්න උත්සහ නොකර ඉන්න. එහෙම උනානම් අද අපි තාමත් දනගානවා නේද?

ඒ වෙනුවට අපි කලේ එම බාධකයම අපේ අභියෝගය විදියට දැක්කා. එහෙම හිතලා ඒ අභියෝගය ජයගන්න නොකඩවා උත්සාහ කලා. වැටෙන්න- වැටෙන්න අපි නැගිටින්න තීරණය කලා. එහි ප්‍රතිඵලයක් විදියට අද අපි නැගිටලා ඇවිදිනවා, දුවනවා.

එහෙම නම් යම් කාර්යයක් කරගැනීමට නොහැකි ලෙස බාධාවෙන කරුණු, එහෙමත් නැතිනම් නිදහසට කරුණු, අපි දකිමු අපිව දිරිමත් කරන අභියෝග ලෙස. එහෙම හිතලා ඒ අභියෝග වලට ශක්තිමත්ම මුහුන දෙමු.

උතුරන වතුර භාජනයක් හෝ කේතලයක් මතකයට ගන්න. මෙම වතුර භාජනයට ගින්දර දමන්න පටන් අරගෙන මොහොතින් ඇවිත් පරීක්ෂා කරලා බැලුවොත් ඔබට පෙනෙන්නේ මොනවගේ දෙයක්ද? වතුර උතුරන දර්ශනයක් වෙනුවට සමහර විට ඔබට පෙනෙන්නේ බොහොම නිහඬව තිබෙන වතුර භාජනයක්, එහෙමත් නැත්නම් බුබුලු කිහිපයක් මතුවන භාජනයක්. හැබැයි ඔබ දන්නවා මතුපිටින් නොපෙනුනත් යටින් වතුර රත්වන බව. එම රත්වීම සෙන්ට්‍රිගේට් අංශක 100 ට ලඟාවීමෙන් වතුර ඉතිරීම සිදුවන බව දැනගෙන ඔබ දිගටම ගින්දර සැපයීම කරගෙන යනවා.

අපගේ ජීවිතයත් එලෙසම තමයි. සමහර අවස්ථාවල අපි ඉතාම මහන්සියෙන්, කැපවීමෙන්, අවංකව අපගේ කටයුතු කරගෙන ගියත් ප්‍රතිඵල නොපෙනෙන්න පුලුවන්. හැබැයි එහෙම කියලා අතරමගදී වතුර භාජනයෙන් ගින්දර ඉවත් කරනවා හා සමානව ඔබේ උත්සාහය අතහැර දැමුවොත් මොකද වෙන්නේ?

ඔබ වතුර භාජනයට දිගටම ගින්දර සැපයීම කරගෙන ගියේ එය කොයිමොහොතක හෝ උතුරන බව විශ්වාස කරගෙනයි. ඒවගේම, විශ්වාසයකින් යුක්තව ජීවිතයේ ඔබ කරගෙන යන කාර්යයන් නොකඩවා කරගෙන යන්න. හරි මොහත පැමිනි විට, වතුර සෙන්ට්‍රිගේට් 100 ට ආවාම උතුරනවා වගේ, එක වරම ඔබට ප්‍රතිඵල පෙනෙන්නට පටන් ගනිවි.

විලක පිහිනන හංසයකු දැක්කහම අපට හිතෙනවා ඌ කොච්චර පහසුවෙන් කිසිම ආයාසයකින් තොරව බොහොම හැඩට විලේ එහා කොනේ ඉඳන් මෙහා කොනට පාවෙනවා කියලා. හැබැයි ටිකක් ලංවෙලා බලනකොට තමයි අපට පැහැදිලි වෙන්නේ මේ හංසයා කොතරම් වේගයෙන් නොනවත්වා උගේ කකුල් දෙක ගසමින් මේ ගමනේ නිරත වෙලා ඉන්නවද කියලා. එතකොට තමයි අපිට තේරෙන්නේ ඌ කොච්චර මහන්සියක් ගන්නවද මේ සමබරතාවය රැකගන්න කියලා.

අපිට අසන්න ලැබෙන, අපි දකින, අපට මුනගැසෙන, ජීවිතය සාර්ථක කරගත් පුද්ගලයන්ගේ කථාවක් මේ හා සමානයි. ඔවුන් අත්පත් කරගත් සාර්ථකත්වයේ ගමනත් ඉතාම පහසුවෙන් ආ ගමනක් කියලා සමහරෙකුට සිතුනත් ඒ ගමන බොහොම අභියෝග වලින් පිරුණ, පසුබෑම් හා පරාජය වීම තුලින් ගමන්කල , කැපවීමෙන් හා දැඩි උත්සාහයෙන් ආ ගමනක් බව පැහැදිලි වෙනවා.

ශ්‍රී පාදස්ථානයට යන්න තීරණය කරන අයට, එහි ලඟා වෙන්න පුලුවන් පාරවල් කිහිපයක්ම තියෙනවා. ඒ වගේම තමයි සාර්ථකත්වයට ලඟාවිය හැකි මාවත්, ක්‍රමවේදයන්ද එකකට වඩා තිබිය හැකියි. හැබැයි මොන පාරෙන් ශ්‍රී පාදස්ථානයට යන්න තීරණය කලත්, කන්ද නගින්න වෙනවාමයි. ශීතලට මුහුණ දෙන්න වෙනවා. කකුල් දෙක රිදෙනවා. වෙහෙස මහන්සිය දැනෙනවා.

මේ වගේම තමයි, ඔබ සාර්ථකත්වයට පත්වීමට තීරණය කළොත් ඔබටත් ප්‍රශ්න වලට මුහුණ දීමට සිදුවෙනවා. නොයෙක් විදියේ අභියෝග පැමිණෙනවා. පසුබෑම් වලට ලක්වෙනවා. හිත් රිදීම් වලට මුහුණ දෙන්න සිදුවෙනවා. ඒක දරාගෙන දැඩි කැපවීමෙන් කටයුතු කළයුතු වෙනවා.

මම මෙහෙම කියනකොට, සමහර පුද්ගලයන්ගේ සාර්ථකත්වය බොහොම ලෙහෙසියෙන් ලඟා කරගත් දෙයක්ය කියලා අපිට හිතුනත් මතක තබාගත යුත්තේ අර විලේ පිහිනන හංසයා වගේ අපිට නොපෙනෙන සේ නොකඩවා සිදුවන දැඩි කැපවීමයි, මහන්සිවීමයි. උත්සාහය, නොනවතී ක්‍රියාත්මක වීම හා අභියෝග වලට මුහුණ දීම සාර්ථකත්වය කරා යන ගමනක අනිවාර්යය අංගයන්ය.

මෙන්න මේ වගේ, අපි බොහොම ලෙහෙසියට කිව්වට "වාසනාව" කියලා, ඒ තුල ගැබ්වෙලා තියෙන ගුණාංග රාශියක් තියෙනවා. මෙන්න මේ ගුණාංග වර්ධනය කරගැනීම ඔබ විසින් කලයුතුව තිබෙනවා, ඔබගේ වාසනාව උරගා බැලීමට නම්. මෙම ගුණාංග වර්ධනය කරගැනීම තුල ඔබගේ වාසනාව ලඟා කරගැනීමේ සහතිකය ඔබටම ලියාගත හැකියි.



නුවන් සමරපති
පුද්ගල සංවර්ධන පුහුණුකරු
කතෘ - U Turn ග්‍රන්ථය
0450 265 167
www.promindsaustralia.com.au

## අමරදේව ශූරීන්ගේ සිඩ්නි සම්ප්‍රාප්තිය






ආචාර්ය මහේෂ් බණ්ඩාර







හෙළදිව මහා ගාන්ධර්ව පණ්ඩිත් අමරදේවයන්ගේ සිඩ්නි ප්‍රසංගය පිළිබඳව ආචාර්ය උබයසිරි විජයනන්දවික්‍රම විසින් ලියන ලද සටහන ළබන කළාපයේ පළවන බව කරුණාවෙන් සළකන්න